ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

**81 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2005 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2005 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2005

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II
# வணிகக் கல்வியும் கணக்கீடும் II
# Business and Accounting Studies II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hour

❖ පිළිතුරු ලිවීමේ දී පැහැදිලි අත් අකුරෙන් ලියන්න.

---

## I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. (i) ප්‍රජා පරිසරයට ඇතුළත් වන සාධක හතරක් නම් කරන්න.
(ii) පුද්ගල ඉතිරිකිරීම් වල අරමුණු තුනක් නම් කරන්න.
(iii) ණයකර හා සාමාන්‍ය කොටස් අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(iv) ප්‍රවාහනයේ මූලිකාංග මොනවාද?
(v) කැපකරු නියෝජිතයා යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(vi) සුළු මුදල් අග්‍රිමය යනු කුමක් ද?
(vii) අවිනිශ්චිත ගිණුමක් විවෘත කරන්න සිදුවන්නේ කුමන අවස්ථාවකදී ද?
(viii) ව්‍යාපාරයක මුදල් පොතේ බැංකු ශේෂය හා බැංකු ප්‍රකාශණයේ සඳහන් ශේෂය සමාන නොවීමට බලපෑ හැකි කරුණු 4ක් සඳහන් කරන්න.
(ix) පොදු ජ්නලයේ සටහන් කරන සටහන් වර්ග 4ක් නම් කරන්න.
(x) නිෂ්පාදන පිරිවැයේ මූලිකාංග මොනවාද?

*(ලකුණු 2 x 10 = 20යි)*

## II කොටස A - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) රක්ෂණ මූලධර්ම මොනවාද ? ඔබ කැමති එක් මූලධර්මයක් පැහැදිලි කරන්න.
(ii) රථ වාහන රක්ෂණයත් සොරබිය රක්ෂණයත් සඳහා රක්ෂණ ඔප්පු ලබා ගත හැක්කේ කිනම් රක්ෂණ වර්ගය යටතේ ද?
(iii) පහත සඳහන් එක් එක් වගන්තිය වැරදි ද නිවරදි ද යන්න සටහන් කරන්න. ඒ සඳහා ඒ එක් එක් වගන්තියට අදාල අක්ෂරය පමණක් ලියාගෙන එය ඉදිරියෙන් වැරදි හෝ නිවරදි යනුවෙන් ලියන්න.
(අ) ව්‍යාපාරිකයෙක් ගිනි රක්ෂණය යටතේ ඔහුගේ ගොඩනැගිල්ලකට රු. 50,000 ක රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන ඇත. ගොඩනැගිල්ලට ගින්නෙන් රු. 20,000 ක හානියක් සිදු විය. ඒ හානියට වන්දි වශයෙන් රු. 50,000 ම ලබා ගත හැකිය.
(ආ) තෙවන පක්ෂ අවම රක්ෂණ ඔප්පුවක් නො ලබා මෝටර් රථයක් පාරේ ධාවනය කළ නොහැක.
(ඉ) සේවක වන්දි රක්ෂණයෙන් හාම්පුතුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමක් සිදු වේ.
(ඊ) මුදල් භාරකරුවන් හා ගබඩා භාරකරුවන් වෙනුවෙන් ස්වාමි පක්ෂය රක්ෂණ ඔප්පු ලබා ගන්නේ සොරබිය රක්ෂණය යටතේ ය.
(උ) ලංකාවේ ප්‍රථම රක්ෂණ ආයතනය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවයි.

*ලකුණු 10*

03. (i) හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.
(ii) සෙසු ව්‍යාපාර සංවිධාන හා සසඳන කළ කේවල ස්වාමි (ඒකපුද්ගල) ව්‍යාපාර වල දැකිය හැකි විශේෂ ලක්ෂණ 4ක් සඳහන් කරන්න.
(iii) සීමිත පෞද්ගලික සමාගම් හා සීමිත පොදු සමාගම් අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(iv) සමුපකාර ව්‍යාපාරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
(v) සීමිත සමාගමක් ලියාපදිංචි කිරීමේදී ඉදිරිපත් කළ යුතු ලියවිල හතරක් නම් කරන්න.

*ලකුණු 10*

## II කොටස B - ගිණුම්කරණ අධ්‍යයනය

04. 1. ආරම්භක ජ්නල් සටහන් ලියා දක්වන්න.

| | | | |
|---|---:|---|---:|
| ගොඩනැගිලි | 150,000 | මෝටර් රථ | 250,000 |
| යන්ත්‍ර | 125,000 | ලී බඩු උපකරණ | 125,000 |
| ණයහිමියෝ | 32,000 | උපචිත රක්ෂණය | 12,500 |
| බැංකු ණය | 425,000 | කලින් ගෙවූ ගෙවල් කුලී | 10,000 |
| ණයගැතියෝ | 20,000 | බැංකු අයිරාව | 35,000 |
| මුදල් ශේෂය | 18,450 | බඩුතොගය | 2,000 |

2. පහත වැරදි නිවරදි කිරීමට අදාල ජනල් සටහන් ලියන්න.
   1. විවිධ ණයගැතියන් රු. 1250 ශේෂ පිරික්සුමේ ඇතුළත් කර ඇත්තේ රු. 5210 ක් ලෙසය.
   2. ගෙනඒමේකුලි රු. 300 ක් ගෙනයාමේ කුලි ගිණුමේ ඇතුළත් කර ඇත.
   3. ආපසු යැවුම් රු. 450 ක් ණයහිමියාගේ ගිණුමේ සටහන් කර ඇති නමුත් ආපසු යැවුම් ගිණුමේ සටහන් කර නැත.
   4. අයිතිකරුගේ ආදයම් බදු රු. 1000 ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවන ලද අතර එය විවිධ වියදම් වල සටහන් කර ඇත.
   5. වර්ෂය තුළ ගෙවනු ලැබූ රු. 700 ක රක්‍ෂණ ගාස්තු මුදල් පොතේ නිවරදිව සටහන් කර ඇති නමුත් එය සංග්‍රහ වියදම් ගිණුමට රු. 500 ක් ලෙස හර කර ඇත.

*ලකුණු 10*

05. 1. පහත දැක්වෙන්නේ සුවදපාලගේ ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු සාරාංශයක් හා බැංකුව විසින් එවන ලද ප්‍රකාශණයේ සාරාංශයකි. සංශෝධිත මුදල් පොතක් පිළියෙළ කර බැංකු සැසඳුම් විස්තරයක් පිළියෙළ කරන්න.

**මුදල් පොත**

| දිනය | විස්තරය | බැංකු | දිනය | විස්තරය | බැංකු |
|---|---|---|---|---|---|
| 01-01 | ශේෂය ඉ/ගෙ | 23,000 | 03. | ගෙවල් කුලි චෙක් අංක 0050 | 2,000 |
| 05 | මුදල් තැන්පත් | 4,600 | 07 | කුසුම් චෙක් අංක 0051 | 1,400 |
| 07 | මුදල්/චෙක් තැන්පත් | 800 | 16 | ගැණුම් චෙක් අංක 0052 | 3,500 |
| 23 | මුදල්/චෙක් තැන්පත් | 4,000 | 26 | ලී බඩු චෙක් අංක 0053 | 1,300 |
| 30 | චෙක් තැන්පත් | 8,000 | 27 | දැහැමි වෙළෙඳ සැල චෙක් අංක 0054 | 4,800 |
| | | | 29 | මුදල් චෙක් චෙක් අංක 0055 | 3,600 |
| | | | 30 | ශේෂය ප/ගෙ | 23,800 |
| | | 40,400 | | | 40,400 |
| 02-01 | ශේෂය ඉ/ගෙ | 23,800 | | | |

**බැංකු ප්‍රකාශණය**

| දිනය | විස්තරය | ආපසු ගැනිම් හර | තැන්පත් කිරීම් බැර | ශේෂය |
|---|---|---|---|---|
| 01-01 | ශේෂය ඉ/ගෙ | | | 23,000 |
| 05 | මුදල් තැන්පත් | | 4,600 | 27,600 |
| 06 | චෙක් 0050 | 2,000 | | 25,600 |
| 10 | තැන්පත් චෙක් | | 800 | 26,400 |
| 12 | බැංකු ගාස්තු | 200 | | 26,200 |
| 25 | චෙක් 0051 | 1,400 | | 24,800 |
| 26 | චෙක් අංක 0053 | 1,300 | | 23,500 |
| 27 | ප්‍රේෂණ මුදල් | | 5,000 | 28,500 |
| 31 | චෙක් අංක 0055 | 3,600 | | 24,900 |

2. පවාහන් නිෂ්පාදන ආයතනයක 2004 ජනවාරි මාසයේ නිපද වූ පාවාහන් නිෂ්පාදන තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| සම් මිල දී ගැනීම් | 80,000 | විදුලිය | 12,225 |
| කම්හල් රක්‍ෂණය | 15,000 | ඉන්ධන හා බලය | 19,525 |
| සේවක වැටුප් | 32,000 | වෙනත් සෘජු වියදම් | 11,250 |
| ගම් බෝතල් | 5,500 | ඇණ | 2,500 |
| මුරකරු වැටුප් | 7,500 | | |

මාසය තුළ නිපද වූ පාවහන් සඛ්‍යාව 700 ක් නම් ඒකක පිරිවැය කියද? *ලකුණු 10*

සිසිර කුමාර